**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2015**

-------------------------------------------------------------

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරිය) 62 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අරමුදලේ ක්‍රියාකාරීත්වය.**

---------------------------

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 18 වගන්තිය ප්‍රකාරව උක්ත අරමුදලේ පාලනය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බව සඳහන්ව ඇතත් පනත සංශෝධනය කිරීමකින් තොරව 2010 දෙසැම්බර් 13 දිනැති අංක 12/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මඟින් අරමුදලේ මාසික වැටුප් ලේඛන පිළියෙල කිරීම හා ලිපිගොනුවල භාරකාරත්වය 2011 ජනවාරි 01 දින සිට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත විමධ්‍යගත කර තිබුණි.

**1.5 අහිතකර මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 අහිතකර මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01**

**i.** ප්‍රමිතියට පටහැනිව මුදල් පදනම අනුව ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කර තිබුණි.

**ii** ප්‍රමිතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) අරමුදලට ලැබෙන සියළුම ලැබීම් හා ගෙවීම් අරමුදලේ ආදායම් හා වියදම් ගිණුම මඟින් වාර්තා කළ යුතු නමුත් මෙම අරමුදලට අදාල වන්නා වූ ගනුදෙනු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු ගිණුම හරහා සිදු කර තිබුණි.මෙම හේතූන් නිසා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.1,201,716,074 ක් හා වර්ෂයේ විශ්‍රාම වැටුප් වියදම රු.1,201,716,074 ක් ගිණුම් වලින් අත් හැරී තිබුණි. කෙසේ වුවද අරමුදල විසින් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන ලද දායක මුදල් ලැබීම්, ආදායම් හා වියදම් ගිණුමට සටහන් නොකළ යුතු වැරදි බැර කිරීම් වල එකතුව සමඟ රු.85,094,242 ක් විශ්‍රාම වැටුප් ගෙවීම් ලෙස දක්වා තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් සටහනක් මඟින් හෝ පෙන්නුම් නොකිරීම නිසා අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම් ගිණුම් තුළින් නිවැරදිව පිළිබිඹු වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආයතන දායක මුදල රු.90,813,750 ක් වුවත්, වර්ෂය තුලදී ලැබී තිබුණු රු. 85,094,242 ක මුදල උපචිත පදනම සැලකිල්ලට නොගෙන ආදායම් හා වියදම් ගිණුමේ ගිණුම් ගත කිරීම නිසා ආදායම් හා වියදම් ගිණුමේ රු. 5,721,764 ක අතිරික්තය නිරූපණය වන බව නිරීක්ෂණය විය.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) i 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.1,488,836,178 ක් වුවත් බිල්කිරීමේ ලේඛන අනුව එම ශේෂය රු.1,425,009,276 ක් වුයෙන් රු. 63,826,902 ක වෙනසක් නිරීක්ෂණය විය.

ii සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ලෙස සඳහන් දායක මුදල් ශේෂය හා බිල් පොතේ සඳහන් ශේෂය අතර කාලයක් තිස්සේ වෙනස්කම් පවතින නමුත්, කිසිම වර්ෂයකදී ඒ සඳහා ගැලපීම් කර නොතිබුණි. එම වෙනස එක් එක් වර්ෂයන් සඳහා වෙනස් අගයන් ගෙන තිබුණි. එය 2012 වර්ෂයේදී රු.187,490,163 කින්ද, 2013 වර්ෂයේදී රු.62,897,485කින්ද, 2014 වර්ෂයේදී රු.64,018,765 කින්ද වෙනස් වී තිබුණු අතර එයට බලපෑ හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) විශ්‍රාම වැටුප් පරිගණක දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් ලබන ලද පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ විශ්‍රාමිකයන් සංඛ්‍යාව 2015 වර්ෂයේ 66,158 ක් හා 2014 වර්ෂයේ 61,634 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව අරමුදලට විශ්‍රාමිකයන් 4,524 දෙනෙකුගේ එකතු වීමක් අනාවරණය විය. 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ලැබූ විශ්‍රාමිකයින්ගෙන් සමන්විත වූ මෙම අරමුදල සඳහා නව විශ්‍රාමිකයින් එකතු වීමක් සිදු නොවන බැවින් විශ්‍රාමිකයින් 4524 ක් සඳහා 2015 වර්ෂය තුල දී විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳව හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2015 වර්ෂය තුල පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට විශ්‍රාමිකයින් 331 ක් හා පළාත් පාලන සේවා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට විශ්‍රාමිකයින් 4,752 ක් එකතු වී ඇති බව පරිගණක දත්ත පද්ධතියේ තොරතුරු අනුව නිරීක්ෂණය විය. ඒ අනුව 2015 වර්ෂය තුල මෙම අරමුදලේ විශ්‍රාමිකයන් 5,083 දෙනෙකු මියගිය බව අනාවරණය වේ. නමුත් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ දිස්ත්‍රික්ක 25 ට අයත් පළාත් පාලන ආයතන සියල්ලේම මිය යාම් සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුණි. අරමුදලේ සාමාජිකයින්ගේ මියයාම් විස්තර රැස්කිරීමට කටයුතු කර නොතිබූ බැවින් ඉහත තොරතුරු සනාථ කිරීමට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) පසුගිය වර්ෂ කිහිපයක පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී 2011 වර්ෂයේදී රු. 250,634,865 ක අඩු වීමක්ද 2012 වර්ෂයේදී රු.147,876,598 ක වැඩි වීමක් ද 2013 වර්ෂයේදී රු. 41,422,817 කින් වැඩි වීමක්ද 2014 වර්ෂයේදි රු. 5,873,269 ක වැඩිවීමක්ද 2015 වර්ෂයේදී රු. 317,117,795 ක වැඩිවීමක්ද පෙන්නුම් කරන නමුත් විශ්‍රාම වැටුප වෙනස්වීමට තුඩුදුන් හේතුන් පිළිබඳව විශ්ලේෂණාත්මකව ගණනය කිරීම් සහිතව පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ 04 ක කාලයක සිට පළාත් පාලන ආයතන 79 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු රු.461,959,516 ක හිඟ දායක මුදල අයකර ගැනීමට අරමුදල විසින් කටයුතු කර නොතිබූ අතර එය සමස්ථ හිඟ දායක මුදලින් සියයට 31 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අදාලව පළාත් පාලන ආයතන 19 කින් ලබාගත් තොරතුරු අනුව පළාත් පාලන ආයතන වලින් ගෙවිය යුතු ශේෂය හා විශ්‍රාම වැටුප් අරමුදලට ලැබිය යුතු ශේෂය අතර රු. 173,856,932 ක වෙනසක් පවතින බව විගණනයේදි නිරීක්ෂණය විය.

### 2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම. |
|---|---|---|
| (අ) | 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20 වගන්තිය හා 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4:3 ඡේදය | පළාත් පාලන ආයතන විසින් අරමුදලට ගෙවිය යුතු රු. 1,487,828,844 ක හිඟ දායක මුදල් පළාත් පාලන ආයතනවලට ගෙවීමට ඇති යම් මුදලකින් අඩුකර ගැනීමට හෝ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 (අ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ඒ ඒ මාසයේ අරමුදලට අදාල සාමාජිකයන්ගේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ඒවා ගෙන්වා ගැනීමට ද අරමුදල පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2011 දෙසැම්බර් 15 දිනැති අංක 4/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | විශ්‍රාම වැටුප් වර්ගීකරණයට අනුව අරමුදලේ වියදම පරිගණක පද්ධතිය මඟින් ලබාගැනීමට උපදෙස් දී තිබුණ ද ඒ අනුව වියදම ලබාගෙන ගිණුමේ දැක්වීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,721,764 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 38,013,664 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,291,900 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද ඉහත 2.2 ඡේදයේ දක්වා ඇති ගිණුම්කරණ අඩුපාඩු මත මෙම මූල්‍ය ප්‍රතිඵලය වෙනස් වනු ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 15 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත දීමනා ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබූ නමුත් 253 වැය ශිර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණය |
|---|---|---|
| (අ ) ගිණුම්කරණය | - | අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) දායක මුදල් අයකිරිම | - | හිඟ දායක මුදල් හා සමාලෝචිත වර්ෂයේ දායක මුදල් නිසිපරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) සාමාජික ලේඛනය යථාවත් කිරීම | - | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු කැඳවා සාමාජික සංඛ්‍යාවට මිය යාම් ගලපමින් යාවත් කාලීන නොකිරීම හා ඒ අනුව විශ්‍රාම වැටුප් වියදම තහවුරු කර නොතිබීම. |